## සාමාන්‍ය සමය විසිදෙවන ඉරුදින | දේව ප්‍රකාශන

31-08-14

## පළමුවන දේව ප්‍රකාශනය

ජෙරමියා 20:7-9

ජෙරමියා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**සමිඳාණන්ගේ වචනය මාගේ නින්දාවටත්, සරදමටත් හේතුව වී තිබේ.**

අහෝ සමිඳුනි! ඔබ තුමාණෝ මා මුළා කළ සේක. මම ද මුළා වීමි. ඔබ තුමාණෝ මට වඩා බලවන්ත ය. ඔබ තුමාණෝ මා පරාජයට පත් කළ සේක. දවස පුරා සියල්ලෝ මට කවටකම් කරති. ඔව්හු මට උසුළු-විසුළු කරති. මා කතා කරන සෑම විට ම මොරගසමින්, 'සැහැසිකම', 'විනාශය' කියා මම කියමි. ඔබ තුමාණන්ගේ වචනය දවස පුරා ප්‍රකාශ කිරීම මා නින්දාවටත්, සරදමටත් හේතුව වී තිබේ. 'මම සමිඳාණෝ අමතක කර එතුමාණන්ගේ නාමයෙන් තවත් කතා නොකරන්නෙමි'යි කී විට, ඔබ තුමාණන්ගේ වචනය මාගේ සිතේ ගින්නක් මෙන් ඇවිලෙයි. එය මාගේ ඇටකටු තුළ සැඟවී ඇත. එය සඟවා තබාගැනීමෙන් මම බොහෝ වෙහෙසට පත් වීමි. එහෙත්, තවත් එය තබාගැනීම මට නොකළ හැකි ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 63:1-5, 7-8

පිළිතුර: දෙවිඳුනි, අපි ඔබ කෙරෙහි සා පිපාසා වෙමු.

ගීය: දෙවිඳුනි, මාගේ දෙවිඳුනි, ඇඩි ආශාවෙන් මම ඔබ සොයන්නෙමි. මා හද ඉතා ගිජු ලෙස ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නේ ය. වියළි බිම ජලයට පිපාසා වන පරිදි මම ඉතා ආශාවෙන් ඔබ වෙත ඇදී යන්නෙමි. ඔබේ ශුද්ධස්ථානයේ දී මම ඔබ දෙස ඕනෑකමින් බලා සිටින්නෙමි.

ඔබේ බලය ද මහිමාලංකාරය ද නරඹන්නෙමි. ඔබේ තිර පෙම මාගේ ජීවිතයටත් වඩා මට අගනේ ය; මාගේ මුව ඔබට ප්‍රශංසා කරන්නේ ය. මුළු ජීවිතයේ දී ම මම ඔබට ප්‍රශංසා කරන්නෙමි; ඔබේ නාමයෙන් අයැදිමින් මම ඔබ දෙසට දෑත නගන්නෙමි.

රස මස'වුලින් මෙන් මම සෑහීමට පත් වන්නෙමි; මා මුවින් තුති ගී ගයා මම ඔබ පසසන්නෙමි. ඔබ වහන්සේ මාගේ ආධාරය වූ සේක. ඔබේ පියාපත් සෙවණෙහි මම ප්‍රීති වන්නෙමි. ම සිතෙහි ඔබ කෙරෙහි තද ඇල්මක් ඇත; ඔබ දකුණතින් මා උසුලන සේක.

## දෙවන දේව ප්‍රකාශනය

රෝම 12:1-2

පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**"ඔබගේ ශරීර ජීවමාන යාගයක් කොට ඔප්පු කරන්න."**

සහෝදරයෙනි, දෙවියන් වහන්සේ ඉමහත් දයාවක් පෙන් වූ බැවින්, ඔබගේ ශරීර දෙවියන් වහන්සේට කැප කළ, උන් වහන්සේට ප්‍රසන්න වූ ජීවමාන යාගයක් කොට ඔප්පු කරන මෙන් ඔබගෙන් උදක් ම ඉල්ලමි. සැබෑ බුද්ධිමය නමස්කාරය එය වේ. ඔබ ලෝක ව්‍යවහාරය අනුව හැඩ නොගැසී, සිත අලුත් කරගැනීමෙන් වෙනස් අය වන්න. එවිට, දෙවියන් වහන්සේගේ කැමැත්ත, එනම්, යහපත් වූ, පිළිගත යුතු වූ, සම්පූර්ණ වූ දේ කුමක් ද කියා ඔබට තේරුම්ගත හැකි ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුපුවත් ජය නද</u>** එපීස 1 :17-19

ආලේලූයා! ආලේලූයා

අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පියාණන් වහන්සේ, ඔබට දුන් කැඳවීමෙන් කවරාකාර බලාපොරොත්තුවක් ඔබට ලැබී ඇත්දැයි අවබෝධ වන සේ ඔබේ සිත් පහදන සේක්වා.

ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මතෙව් 16:21-27

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"මා අනුගාමී වන්නට කැමැති තැනැත්තා තමකම නසා ආ යුතුයි."**

පේදුරුගේ මහා ප්‍රකාශනයෙන් පසුව ජේසුස් වහන්සේ, තමන් ජෙරුසලමට වැඩම කර, ප්‍රජා මූලිකයන්ගෙන් හා නායක පූජකයන්ගෙන් ද විනයධරයන්ගෙන් ද බොහෝ දුක් වේදනා විඳින්ටත් මරනු ලබන්ටත්, තුන් වන දා උත්ථාන කරනු ලබන්ටත් යන බව සිය ශ්‍රාවකයන්ට දන්වන්න පටන්ගත් සේක. එවිට පේදුරු උන් වහන්සේ පැත්තකට කැඳවා තරවටු කරන්න පටන් ගෙන, "ස්වාමීනි, එය දුරින් ම දුරුවේ වා! එවැන්නක් ඔබට කවදාවත් සිදු නො වේ වා"යි කී ය. එහෙත්, උන් වහන්සේ හැරී, පේදුරුට කතා කොට, "සාතන්, අහකට යව; නුඹ මට බාධාවකි; නුඹ සිතන්නේ මිනිසුන් සිතන විධියට මිස දෙවියන් වහන්සේ සිතන විධියට නොවේ ය"යි වදාළ සේක.

එවිට ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට මෙසේ වදාළ සේක: "යමෙක් මා අනුව එන්න කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරමින් මා අනුව ඒවා! මන්ද, සිය දිවි රැකගන්න කැමැති තැනැත්තේ එය නැති කරගන්නේ ය. මා උදෙසා සිය දිවි නැති කරගන්නා එය රැක ගන්නේ ය. යමෙකු මුළු ලෝකය ම ලබාගත්තත්, සිය දිවි නැති කරගත්තොත් ඔහුට කිනම් ප්‍රයෝජනයක් ද? නොහොත් යමෙකුට සිය දිවි වෙනුවට කුමක් දිය හැකි ද? මනුෂ්‍ය පුත්‍රයාණෝ සිය පියාණන්ගේ තේජශ්‍රීයෙන් තම දූතයන් පිරිවරා වඩින සේක. එකල උන් වහන්සේ එකිනෙකාට තම තමන්ගේ ක්‍රියා අනුව පල විපාක දෙන සේක. සැබැවින් ම මම ඔබට කියමි, මනුෂ්‍ය-පුත්‍රයාණන් ස්වකීය රාජ්‍යශ්‍රීයෙන් වඩිනු දක්නා තෙක් මෙහි සිටින්නවුන්ගෙන් සමහරෙක් කිසි සේත් මරණයට පත් නොවෙති."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.